# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2045/32 – 2017 නොවැම්බර් මස 15 වැනි බදාදා - 2017.11.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත 3 වැනි වගන්තිය යටතේ නියමය

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙම නියෝගය මගින්

01. 2017.11.09 දින හෝ එදිනට පෙර ඔහුගේ/ඇයගේ නමින් ණයවර ලිපිය විවෘත කරන ලද පුද්ගලයකු විසින් සංයෝජිත වර්ගීකරණ අංක 87.03 යටතේ ආනයනය කරන ලද සහ 2018.04.30 දින හෝ එදිනට පෙර ශ්‍රී ලංකා රේගුවෙන් නිෂ්කාශනය කර ගනු ලබන මෝටර් රථයක් සඳහා, 2017.11.09 දින පැවති සහ 2016.11.10 දිනැති අංක 1992/29 දරන *ගැසට් නිවේදනය* හා එයට පසුව සිදු කරන ලද සංශෝධන ඇතුළත් 2017.06.09 දිනැති අංක 2022/30, 2017.06.19 දිනැති අංක 2024/1 හා 2017.07.11 දිනැති අංක 2027/7 දරන *ගැසට් නිවේදනයන්හි* සඳහන්ව ඇති නිෂ්පාදන බදු අනුපාත අදාළ විය යුතු බවත්; සහ

02. ඉහත 01 ඡේදයේ සඳහන් ආනයනික වාහන සඳහා 2017.11.09 දිනැති අංක 2044/32 දරන *ගැසට් නිවේදනයේ* සඳහන් නිෂ්පාදන බදු අනුපාතයන් අදාළ නොවිය යුතු බවත්.

ප්‍රකාශයට පත් කරමි.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2017, නොවැම්බර් මස 15 දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේදී ය.

01 - 82